(නවවැනි පාර්ලිමේන්තුව - පස්වැනි සභාවාරය)

අංක 1(2).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2024 පෙබරවාරි 22 බ්‍රහස්පතින්දා**

---

**2024 මාර්තු 05 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

යුනෙස්කෝ සඳහා වූ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාව පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ නියෝග,— 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 71 වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව සහ අදාළ නියාමන අධිකාරීන් විමසා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2023 නොවැම්බර් 17 දිනැති අංක 2358/70 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.02.20 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනත යටතේ නියෝගය,— 2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනතේ 3(3) වගන්තිය යටතේ වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බද්ද සම්බන්ධයෙන් වැඩබලන මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 සැප්තැම්බර් 21 දිනැති අංක 2350/45 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.02.22 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— එකතු කළ අගය මත බදු පනත යටතේ නියමය,— 2005 අංක 6 දරන පනතින් සංශෝධිත 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2අ වගන්තිය යටතේ එකතු කළ අගය මත බද්ද සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 දෙසැම්බර් 19 දිනැති අංක 2363/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.02.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

සංචාරක හා ඉඩම් අමාත්‍යතුමා සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා,— සංචාරක කටයුතු පනත යටතේ නියමය (අංක 1),— 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 26(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නිර්දේශය මත සංචාරක සංවර්ධන ප්‍රදේශයක් ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් සංචාරක හා ඉඩම් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 ඔක්තෝබර් 06 දිනැති අංක 2352/47 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.02.20 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

සංචාරක හා ඉඩම් අමාත්‍යතුමා සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා,— සංචාරක කටයුතු පනත යටතේ නියමය (අංක 2),— 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 26(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නිර්දේශය මත සංචාරක සංවර්ධන ප්‍රදේශයක් ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් සංචාරක හා ඉඩම් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 ඔක්තෝබර් 06 දිනැති අංක 2352/48 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.02.20 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

විදේශ කටයුතු අමාත්‍යතුමා,— රාජ්‍යතාන්ත්‍රික වරප්‍රසාද පනත යටතේ නියෝගය,— 1996 අංක 9 දරන රාජ්‍යතාන්ත්‍රික වරප්‍රසාද පනතේ 4 සහ 5 වගන්ති යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ කෘෂි වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICRAF) අතර පවතින සත්කාරක රාජ්‍ය ගිවිසුමේ IV, V, VI, IX, X, XI, XII, XIII, XIV, XV සහ XVI වගන්තිවල නියමයන් බලාත්මක කිරීම සම්බන්ධයෙන් විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2023 සැප්තැම්බර් 08 දිනැති අංක 2348/48 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.02.20 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

**2024 මාර්තු 06 බදාදා**

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

බැංකු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

**2024 මාර්තු 19 අඟහරුවාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2/2024

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර ජාතික රෝහලට අයත් ඉඩම් අනවසර පදිංචිකරුවන් විසින් අත්පත් කර ගෙන ඇති බවත්;

(ii) ඒ හේතුවෙන් එම රෝහලට අයිති ඉඩම්වලින් අඩකට වඩා අහිමි වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ අත්පත් කර ගෙන ඇති ඉඩම් අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම්වල අනවසරයෙන් පදිංචි වී සිටින පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) එම පවුල් සම්බන්ධයෙන් මේ වනවිට නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(iv) අනවසර පදිංචිකරුවන් වෙනත් ප්‍රදේශයක පදිංචි කිරීම සඳහා මේ වනවිට සැලසුම් කර තිබේද;

(v) එසේ නම්, එම සැලැස්ම කවරේද;

(vi) අදාළ ආයතන සහ බලධාරීන් විසින් ඊට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

42/2024

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කඹුරුපිටිය, මිරිස්වත්ත වලව්වේ පදිංචිව සිටි සාරා ලෝරෙන්සිනා විජේසිංහ මැතිනිය විසින් තම දෙමාපියන් සිහිවීම පිණිස මාතර, රාහුල විද්‍යාලයට පරිත්‍යාග කරන ලද ගුණතිලක ස්මරණ ශාලාව කඩා ඉවත් කරන ලද බව දන්නේද;

(ii) එසේ නම්, එම ශාලාව කඩා ඉවත් කිරීමට හේතු කවරේද;

(iii) එය කඩා ඉවත් කරන ලද දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගුණතිලක ස්මරණ ශාලාව වෙනුවට ඉදිකරනු ලබන නව ස්මරණ ශාලාව සඳහා ඇස්තමේන්තු මුදල කොපමණද;

(ii) එම මුදල ලබා ගැනීමට අපේක්ෂිත මූලාශ්‍ර කවරේද;

(iii) නව ස්මරණ ශාලාව ඉදිකිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් වැය කරනු ලබන මුදල කොපමණද;

(iv) ඒ සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් මුදල් ප්‍රමාණයක් ලබා දී තිබේද;

(v) එසේ නම්, එම මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) නව ස්මරණ ශාලාවේ ඉදිකිරීම්වලින් මේ වනවිට නිම කර ඇති ප්‍රමාණය කොපමණද;

(ii) ඉතිරි ප්‍රමාණය නිම කිරීමට අපේක්ෂිත දිනය කවරේද;

(iii) එම ඉදිකිරීම් ප්‍රමාද වීමට හේතු කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

310/2024

ගරු හේෂා විතානගේ මහතා,— කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට ක්‍රියාත්මකව පවතින මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් රජයේ ලියාපදිංචි වී ඇති මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iii) රජයේ ලියාපදිංචියකින් තොරව පෙර පාසල් පවත්වාගෙන යා හැකිද;

(iv) පෙර පාසල් අධීක්ෂණය කිරීම සඳහා ක්‍රමවේදයක් තිබේද;

(v) පෙර පාසලක් පවත්වාගෙන යාම සඳහා සම්පූර්ණ කළ යුතු මූලික සුදුසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

355/2024

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්තමාන විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා පත් කළ දිනය;

(ii) එදිනට සහ 2024.01.31 දිනට එක් එක් පරිභෝජන කාණ්ඩයේ විදුලි ඒකකයකට අය කළ ගාස්තුව සහ එම ගාස්තුවේ වැඩි වීම ප්‍රතිශතාත්මකව වෙන් වෙන් වශයෙන්;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) (අ)(i)හි සඳහන් දිනට සහ 2024.01.31 දිනට;

(ii) (අ)(i)හි සඳහන් දිනයේ සිට 2024.01.31 දින දක්වා රතු බිල් නිකුත් කළ සහ විදුලිය විසන්ධි කළ;

විදුලි පරිභෝගිකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 2011.01.01 දිනයේ සිට 2020.12.31 දින දක්වා නව විදුලි සම්බන්ධතා ලබා ගත් සහ විදුලිය විසන්ධි කළ පාරිභෝගිකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන්;

(ii) ඒ අතර වෙනස;

(iii) (අ)(i)හි සඳහන් දිනයේ සිට 2024.01.31 දක්වා විදුලි සම්බන්ධතා ලබා ගත් සහ විදුලිය සම්බන්ධතාවය විසන්ධි කළ පාරිභෝගිකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන්;

(iv) ඒ අතර වෙනස;

(v) වර්තමාන අමාත්‍යවරයාගේ ධුර කාලයේදී විදුලි සම්බන්ධතා ලබා ගත් සහ විදුලිය සම්බන්ධතාවය විසන්ධි කළ විදුලි පාරිභෝගිකයන් සංඛ්‍යාව වාර්ෂික සාමාන්‍ය අගයක් ලෙස;

කොපමණද යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

356/2024

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ රජයේ පාසල් සංඛ්‍යාව, සිංහල මාධ්‍ය, දමිළ මාධ්‍ය සහ සිංහල හා දමිළ මාධ්‍ය ලෙස;

(ii) එම පාසල්වල ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව, 10ට අඩු, 10-20 අතර, 20-50 අතර, 50-100 අතර සහ 100-200 අතර යන වර්ගීකරණය මත;

(iii) රජයේ පාසල් අතරින් අ.පො.ස. (උසස් පෙළ) සඳහා ගණිතය, විද්‍යාව සහ තාක්ෂණවේදය විෂය ධාරාවන් උගන්වනු ලබන පාසල් සංඛ්‍යාව;

(iv) අ.පො.ස (සා.පෙළ) සහ අ.පො.ස (උ.පෙළ) විෂය ධාරාවන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් උගන්වනු ලබන රජයේ පාසල් සංඛ්‍යාව;

එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

366/2024

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ''හඳුනා නොගත්'' වකුගඩු රෝගය වැළඳී ඇති රෝගීන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වකුගඩු රෝගීන් බහුල වශයෙන් වාර්තා වන දිස්ත්‍රික්ක සහ එම එක් එක් දිස්ත්‍රික්කයෙන් වාර්තා වන වකුගඩු රෝගීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) වකුගඩු රෝගීන් වාර්තා වන අනෙකුත් දිස්ත්‍රික්ක සහ එම එක් එක් දිස්ත්‍රික්කයෙන් වාර්තා වන වකුගඩු රෝගීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වකුගඩු රෝගියකු සඳහා රජය විසින් ලබා දෙනු ලබන මාසික දීමනාව කොපමණද;

(ii) මේ වනවිට එම දීමනාව ලබන වකුගඩු රෝගීන් සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

371/2024

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලසාර්ඩ්-ෆ්‍රාන්ස් සමාගමෙන් (M./S Lazards-France) මූල්‍ය උපදේශන සේවා ලබා ගැනීමට ශ්‍රී ලංකා රජය ගිවිසුමකට එළැඹී තිබේද;

(ii) එසේ නම්, එම ගිවිසුම අනුව ඉහත සමාගමේ මූලික වගකීම් කවරේද;

(iii) ඉහත ගිවිසුම ප්‍රකාරව ශ්‍රී ලංකා රජය විසින් ගෙවිය යුතු මුදල හා මේ වනවිට ගෙවා ඇති මුදල ශ්‍රී ලංකා රුපියල් හා එක්සත් ජනපද ඩොලර් වලින් වෙන් වෙන් වශයෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ක්ලිෆර්ඩ් චාන්ස් (M/S Clifford Chance LLP) සමාගමෙන් නීති උපදේශක සේවා ලබා ගැනීමට රජය ගිවිසුමකට එළැඹී තිබේද;

(ii) එසේ නම්, එම ගිවිසුම අනුව ඉහත සමාගමේ මූලික වගකීම් කවරේද;

(iii) ඉහත ගිවිසුම ප්‍රකාරව ශ්‍රී ලංකා රජය විසින් ගෙවිය යුතු මුදල හා මේ වනවිට ගෙවා ඇති මුදල ශ්‍රී ලංකා රුපියල් හා එක්සත් ජනපද ඩොලර් වලින් වෙන් වෙන් වශයෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1242/2024

ගරු කුමාරසිරි රත්නායක මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට පිහිටුවා ඇති ඇති පොලිස් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත පොලිස් ස්ථානවලට හා වෙනත් රාජකාරිවලට යොදවා ඇති පොලිස් නිලධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මේ වනවිට ශ්‍රී ලංකා පොලිස් සේවයේ පුරප්පාඩු පවතී නම්, එම පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික ආරක්ෂාව සඳහා යොදවා ඇති පොලිස් නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැර වෙනත් පුද්ගලයන්ගේ හෝ ආයතනවල ආරක්ෂාව සඳහා පොලිස් නිලධාරීන් යොදවා තිබේද;

(iii) එසේ නම්, එම සංඛ්‍යාව එක් එක් පුද්ගලයා/ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1282/2024

ගරු අසංක නවරත්න මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වන සතුන්ගේ ක්‍රියාකාරකම් හේතුවෙන් බෝග වගාවන්ට වාර්ෂිකව සිදු වන හානිය සම්බන්ධයෙන් තක්සේරුවක් සිදුකර තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

(iii) එම හානි අවම කර ගැනීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1285/2024

ගරු කිංස් නෙල්සන් මහතා,— ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සේවය කරනු ලබන භෞත චිකිත්සකවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් භෞත චිකිත්සකවරයාගේ නම හා ලිපිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් භෞත චිකිත්සකවරුන්ගේ රාජකාරි ස්වභාවය කවරේද;

(iv) ඔවුන්ට ගෙවනු ලබන වැටුප් හා වෙනත් දීමනා කවරේද;

(v) ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ වර්තමාන පසුබෑම මගහරවා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2024 මාර්තු 20 බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

378/2024

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ශුද්ධ වත්කම්වල වටිනාකම කොපමණද;

(ii) වර්ෂ 2018 සිට 2022 දක්වා එම සංස්ථාවේ ලාභය/අලාභය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම සංස්ථාව අලාභ ලබන්නේ නම්, ඊට හේතු කවරේද;

(iv) එම අලාභ මඟහරවා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට හිඟ මුදල් ගෙවීමට ඇති ආයතන කවරේද;

(ii) එම එක් එක් ආයතනයෙන් ලැබිය යුතු හිඟ මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම හිඟ මුදල් අයකර ගැනීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

465/2024

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කිරීමට යෝජිත මහා පරිමාණ බලශක්ති ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම ව්‍යාපෘති මඟින් ජාතික විදුලිබල පද්ධතියට එකතු කිරීමට අපේක්ෂිත විදුලි ඒකක සංඛ්‍යාව කොපමණද;

(iv) පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති මඟින් විදුලි ඒකකයක මිල කෙරෙහි සිදු වන බලපෑම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

510/2024

ගරු රෝහණ බංඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 සිට මේ දක්වා අනුරාධපුර දිස්ත්‍රික්කයේ වැසීගිය රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල් වැසීයාමට බලපාන ලද හේතු කවරේද;

(iv) එම පාසල් නැවත ආරම්භ කිරීමට හෝ එම පාසල් සතු සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

540/2024

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය,— ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති සිනමා ශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් මේ වනවිට චිත්‍රපටි ප්‍රදර්ශනය කරනු ලබන සිනමා ශාලා සංඛ්‍යාව කොපමණද;

(iii) වර්ෂ 2019 සිට මේ දක්වා ජාතික චිත්‍රපටි සංස්ථාව විසින් ප්‍රදර්ශනය කර ඇති චිත්‍රපටි සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) වර්ෂ 2019 සිට මේ දක්වා චිත්‍රපටි නිෂ්පාදනය කිරීම සඳහා ලබා දී ඇති ණය ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

563/2024

ගරු සංජීව එදිරිමාන්න මහතා,— අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය වැවිලි සංස්ථාව සතු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් කොපමණද;

(ii) එම ඉඩම්වල වගා කර ඇති බෝග වර්ග කවරේද;

(iii) සංස්ථාව සතු ඉඩම් අතරින් කෙටිකාලීන වගාවන් සඳහා බදු දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) එම ඉඩම් පිහිටා ඇති ප්‍රදේශ කවරේද;

(v) එම ඉඩම් බදු දීමෙන් මේ වනවිට උපයා ගෙන ඇති ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

588/2024

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වනවිට එම ආයතනවල සේවය කරනු ලබන මුළු සේවකයන් සංඛ්‍යාව කොපමණද ;

(iii) එම සේවකයන් නඩත්තු කිරීම සඳහා රජය විසින් වාර්ෂිකව වැය කරනු ලබන මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ඉහත සඳහන් සියලුම පළාත් පාලන ආයතනවල පවතින නගරාධිපති, සභාපති හා මන්ත්‍රී තනතුරු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකුට ගෙවනු ලබන මුළු මාසික දීමනාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) පළාත්පාලන ආයතනවල සියලු මන්ත්‍රීවරුන් සඳහා රජය විසින් දරනු ලබන මුළු වියදම මාසිකව හා වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) සමෘද්ධි සංවර්ධන නිලධාරින් සහ කෘෂි පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරින් ඇතුළු රජයේ ක්ෂේත්‍ර නිලධාරින්ට තමා සේවය කරනු ලබන කොට්ඨාසය නියෝජනය කරමින් පළාත් පාලන ඡන්දයට ඉදිරිපත් වීමට තිබූ අවස්ථාව අහිමි කරමින් සිදු කරන ලද සංශෝධනය ඉවත් කිරීමට කඩිනමින් කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

610/2024

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා,— අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහයට අනුව පැනවිය හැකි උපරිම දඬුවම මරණ දඬුවම බවත්;

(ii) මරණ දඬුවම ක්‍රියාත්මක කිරීම මේ වනවිට සිදු නොවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මරණ දඬුවම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ලණු ඇතුළු අනෙකුත් ද්‍රව්‍ය සම්පාදනය කර එල්ලුම් ගහ අලුත්වැඩියා කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(iii) අලුගෝසු තනතුර සඳහා බඳවාගැනීමට පියවර ගෙන තිබේද;

(iv) මරණ දඬුවම ක්‍රියාත්මක කිරීමට එරෙහිව බාධාවන් තිබේද;

(v) එසේ නම්, එම බාධාවන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

611/2024

ගරු ජයන්ත සමරවීර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වර්තමාන ගරු ජනාධිපතිතුමා, ජනාධිපති ධුරයට පත්වීමෙන් පසු සහභාගී වී ඇති විදේශීය සංචාරයන් කවරේද;

(ii) එම එක් එක් විදේශීය සංචාරයේදී හමු වූ විදේශීය රාජ්‍ය නායකයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම විදේශීය රාජ්‍ය නායකයන් සමඟ රාජ්‍ය තාන්ත්‍රික ගිවිසුම්වලට එළඹුණේද;

(iv) එසේ නම්, ගිවිසුම්වලට එළැඹි කාරණය එක් එක් ගිවිසුම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) ඉහත සඳහන් එක් එක් විදේශීය සංචාරයේදී ගරු ජනාධිපතිතුමා සමඟ සහභාගී වූ සෙසු නියෝජිත පිරිස වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම එක් එක් විදේශීය සංචාරය සඳහා රජය විසින් වියදම් කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

636/2024

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා,— කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2023 වර්ෂයේදී රජයේ මැදිහත්වීම මත විදේශ රැකියා සඳහා ශ්‍රී ලාංකික සේවකයන් යොමු කර ඇති රටවල් කවරේද;

(ii) එම එක් එක් රට වෙත යොමු කර ඇති සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2023 වර්ෂයේදී රජයේ මැදිහත්වීමකින් තොරව විදේශ රැකියා සඳහා යොමු වී ඇති ශ්‍රී ලාංකික සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම වර්ෂයේදී විදේශීය රැකියාවල නියුතු සේවකයන් විසින් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කර ඇති මුළු විදේශ විනිමය ප්‍රමාණය කොපමණද;

(v) ඉදිරියේදී විදේශීය රැකියා සඳහා ශ්‍රී ලාංකික පුහුණු ශ්‍රමිකයන් යොමු කරවීමට සකස් කර ඇති වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1090/2024

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇති කල්බදු සමාගම් සංඛ්‍යාව කොපමණද;

(ii) විධිමත් පරිදි ලියාපදිංචි කර නොමැති කල්බදු සමාගම් සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන තිබේද;

(iii) කල්බදු සමාගම් විසින් විවිධ පොලී අනුපාත අය කිරීම හේතුවෙන් එම සමාගම් සමඟ ගිවිසුම්ගත වී ඇති පාර්ශ්වයන් දැඩි අපහසුතාවකට පත් වී ඇති බව දන්නේද;

(iv) එම සමාගම් විසින් අය කරනු ලබන පොලී අනුපාතයන් නියාමනය කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙළක් මේ වන විට ක්‍රියාත්මක කර තිබේද;

(v) කල්බදු පහසුකම් ලබා ගන්නා ලද ගනුදෙනුකරුවන් ආරක්ෂා කර ගැනීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2024 මාර්තු 21 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

3/2024

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා,— වනජීවී හා වනසම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සෑම වර්ෂයකම අධික වියළි කාලගුණ තත්ත්ව පවතින කාලවලදී මහනුවර, පන්විල සහ උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස බලප්‍රදේශ ඇතුළු මධ්‍යම කඳුකරයේ බොහෝ ප්‍රදේශවල රක්ෂිත වනාන්තර, ජල පෝෂක ප්‍රදේශ ආශ්‍රිත වනාන්තර සහ කුඩා ලඳු කැළෑ ගිනි තබන බවත්;

(ii) ඒ හේතුවෙන් ජල උල්පත් සිඳීයාම, වර්ෂා කාලයට කඳු මුදුන්වල ඇති ගල් පෙරලීම හා නාය යාම් ඇති වීම වැනි හානි සිදු වන බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, ඉහත ගිනි තැබීම් වැළැක්වීම සඳහා පියවර ගෙන තිබේද;

(ii) උණුසුම් කාලගුණයත් සමඟ ගිනි ගැනීම් සීඝ්‍රයෙන් පැතිරීම පාලනය කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(iii) සංවේදී පරිසර පද්ධති ආරක්ෂා කිරීම සඳහා තිරසර විසඳුමක් ලබා දෙන්නේද;

(iv) එසේ නම්, එම විසඳුම කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

43/2024

ගරු බුද්ධික පතිරණ මහතා,— වනජීවී හා වනසම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) සිංහරාජ ලෝක උරුම වන රක්ෂිතය වටා පිහිටි රක්ෂිත වනාන්තර 13ක් සිංහරාජ ලෝක උරුම වන රක්ෂිතයට ඇතුළත් කර එම වන රක්ෂිතයේ භූමි ප්‍රමාණය හෙක්ටයාර 30,000ක් දක්වා ඉහළ නැංවීමට අදාළ ගැසට් නිවේදනයකට හිටපු ජනාධිපති ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් 2019 වර්ෂයේදී අත්සන් තබා ඇති බවත්;

(ii) එහෙත්, එම ගැසට් නිවේදනය මේ වනතෙක් ප්‍රකාශයට පත් කර නොමැති බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) ඉහත ගැසට් නිවේදනය අනුව සිංහරාජ ලෝක උරුම වන රක්ෂිතයට ඇතුළත් කිරීමට යෝජිතව තිබූ එක් එක් රක්ෂිත වනාන්තරය සහ ඒවායේ භූමි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් අක්කරවලින් කොපමණද;

(ii) එම ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කිරීම ප්‍රමාද වීමට බලපාන ලද හේතු කවරේද;

(iii) ඉහත සඳහන් ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කිරීමට පියවර ගන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1126/2024

ගරු ඩී. වීරසිංහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයෙන් පසු ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවයට බඳවාගන්නා ලද පුද්ගලයන්ට හිමි වන විශ්‍රාම වැටුප, දායක විශ්‍රාම වැටුපක් බව දන්නේද;

(ii) රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ මත හිමි විශ්‍රාම වැටුප සම්බන්ධයෙන් තීරණය කරන බව පත්වීම් ලිපියේ සඳහන් කර තිබේද;

(iii) එසේ නම්, ඉදිරියේදී මෙම රාජ්‍ය සේවකයන්ට විශ්‍රාම වැටුප් හිමිකම ලබා දීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1146/2024

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාර්ග කිලෝ මීටර් ලක්ෂයක් කාපට් කිරීමේ ව්‍යාපෘතිය යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ කාපට් කර මේ වනවිට වැඩ අවසන් කර ඇති මාර්ගවල දිග කොපමණද;

(ii) එම මාර්ග කවරේද;

(iii) මේ දක්වා වැඩ අවසන් කර නොමැති මාර්ගවල දිග කොපමණද;

(iv) එම මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රත්නපුර-ඇඹිලිපිටිය මාර්ගයේ පැල්මඩුල්ල සිට පල්ලේබැද්ද දක්වා කොටස අබලන් වී ඇති බවත්;

(ii) ඉහත මාර්ග කොටස නැවත කාපට් අතුරා සංවර්ධනය කිරීමේ කටයුතු 2023 වර්ෂයේදී ආරම්භ කරන ලද නමුත් මේ වනවිට එහි වැඩ කටයුතු නවතා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) එම මාර්ග කොටස කාපට් අතුරා සංවර්ධනය කිරීමේ කටයුතු නැවත ආරම්භ කිරීමට කටයුතු කරන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1152/2024

ගරු නීතිඥ මධුර විතානගේ මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) උමා ඔය ව්‍යාපෘතියේ වැඩකටයුතු අවසන් කර තිබේද;

(ii) ඒ සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(iii) එම ව්‍යාපෘතිය විවෘත කරනු ලබන දිනය කවරේද;

(iv) එම ව්‍යාපෘතිය මඟින් ආවරණය කරනු ලබන ප්‍රදේශ කවරේද;

(v) ඉහත ව්‍යාපෘතිය තුළින් අස්වද්දනු ලබන කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1248/2024

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉහළ යන ජීවන වියදමට සමගාමීව පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප් වැඩි කිරීමට ගෙන ඇති පියවර;

(ii) තවමත් එවැනි පියවර ගෙන නොමැති නම් ඊට හේතු;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පවතින ආර්ථික අර්බුදවලදී කාන්තා ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ගෙන ඇති විශේෂ ක්‍රියාමාර්ග;

(ii) වත්මන් ආර්ථික අර්බුදයට මුහුණ දීම සඳහා කාන්තාවන් ශ්‍රම බලකායට එක්වීමේ ප්‍රවණතාවක් පවතින බැවින්, කාන්තා ශ්‍රමිකයින්ගේ දරුවන්ට ළමා ආරක්ෂණය, පෝෂණය සහ එවැනි සහාය ලබා දීමට ගෙන ඇති ක්‍රියාමාර්ග;

(iii) විදෙස්ගත ගෘහ සේවිකාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ගෙන ඇති පියවර;

(iv) තවමත් එවැනි පියවරක් ගෙන නොමැති නම් ඊට හේතු;

කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1252/2024

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලෝකයේ බොහෝ රටවල් මේ වනවිට පෞද්ගලික වෛද්‍ය අධ්‍යාපනය ප්‍රවර්ධනය කරනු ලබන බව දන්නේද;

(ii) බටහිර වෛද්‍ය අධ්‍යාපනය ලබා දෙනු ලබන ශ්‍රී ලංකාවේ ඇති පෞද්ගලික වෛද්‍ය අධ්‍යාපන ආයතන සංඛ්‍යාව කොපමණද;

(iii) එම ආයතනවල නම් කවරේද;

(iv) ඉහත සඳහන් පෞද්ගලික වෛද්‍ය අධ්‍යාපන ආයතනවල ඉගෙනුම ලබන සිසුන්ට අවශ්‍ය සායනික පුහුණුව සඳහා පවතින රජයේ ශික්ෂණ රෝහල් සංඛ්‍යාව කොපමණද;

(v) එම රෝහල්වල නම් කවරේද;

(vi) ශ්‍රී ලංකාවේ පෞද්ගලික බටහිර වෛද්‍ය අධ්‍යාපනය දියුණු කිරීමට හා ප්‍රවර්ධනය කිරීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1281/2024

ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා නාගරික සංවර්ධන අධිකාරිය විසින් මොනරාගල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ව්‍යාපෘතියේ නම සහ ඒ සඳහා වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ව්‍යාපෘති අතරින් මේ වනවිට වැඩ අවසන් කර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(iv) මේ වනවිට වැඩ අවසන් කර නොමැති ව්‍යාපෘති සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(v) එම ව්‍යාපෘතිවල වැඩ අවසන් නොකිරීමට හේතු කවරේද;

(vi) ඒවායේ වැඩ කඩිනමින් අවසන් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1283/2024

ගරු අසංක නවරත්න මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ රජයේ රෝහල්වල මේ වනවිට පවතින මානව සම්පත් හා භෞතික සම්පත් ඌනතාවයන් සම්බන්ධයෙන් සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(ii) එම ඌනතා සපුරාලීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1286/2024

ගරු කිංස් නෙල්සන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතනවල නම් කවරේද;

(iii) වර්ෂ 2018 සිට මේ දක්වා එම එක් එක් පළාත් පාලන ආයතනයේ වාර්ෂික ආදායම හා වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන අතරින් මූල්‍යමය හා භෞතික සම්පත් හිඟ පළාත් පාලන ආයතන නගා සිටුවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

**2024 මාර්තු 22 සිකුරාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

311/2024

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර, කුරුවිට, බෝපත් ඇල්ල නැරඹීමට පැමිණෙන දේශීය හා විදේශීය සංචාරකයන්ගෙන් මුදල් අයකරන්නේද;

(ii) එසේ නම්, එම මුදල් අයකර ගනු ලබන ආයතනය කවරේද;

(iii) ඒ තුළින් එම ආයතනය උපයනු ලබන වාර්ෂික ආදායම කොපමණද;

(iv) එම ආදායම යොදා ගනිමින් බෝපත් ඇල්ල නැරඹීම සඳහා පැමිණෙන සංචාරකයන්ට අවශ්‍ය පහසුකම් සංවර්ධනය කිරීමට පියවර ගෙන තිබේද;

(v) බෝපත් ඇල්ල නැරඹීම සඳහා පැමිණෙන දේශීය ළමා සංචාරකයකුගෙන් හා විදේශීය ළමා සංචාරකයෙකුගෙන් අයකරනු ලබන මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

357/2024

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ මහේස්ත්‍රාත් අධිකරණවල සහ මහාධිකරණවල විභාග වන ළමා අපචාරවලට අදාළ නඩු සංඛ්‍යාව;

(ii) එම සංඛ්‍යාව, නඩු විභාගය ආරම්භ කර වර්ෂ 2, 4, 6, 8 සහ 10 යන කාල වර්ගීකරණය මත පදනම්ව එක් එක් දිස්ත්‍රික්කය අනුව;

(iii) වර්ෂ 2020 සිට මේ දක්වා අධිකරණ කටයුතු වලට යොමු වී නොමැති නමුත් ශ්‍රී ලංකා පොලිසියට හෝ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත කර ඇති ළමා අපචාර පැමිණිලි සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව;

(iv) වර්ෂ 2018 සිට 2022 දක්වා සිදු වී ඇති ළමා අපචාර හේතුවෙන් ලිංගික හිංසනයට ලක් වී ඇති දරුවන් සංඛ්‍යාව ස්ත්‍රී හා පුරුෂ සමාජභාවය අනුව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පොලිසියට හෝ අධිකාරියට වාර්තා නොවන ළමා අපචාර සම්බන්ධයෙන් දත්ත තිබේද;

(ii) එසේ නම්, එම ළමා අපචාර සංඛ්‍යාව වාර්ෂිකව කොපමණද;

(iii) පසුගිය වර්ෂ දෙක තුළ ළමා අපචාර ක්‍රමිකව වර්ධනය වී ඇති බව පිළිගන්නේද;

(iv) එසේ නම්, ඊට හේතු කවරේද;

(v) ළමා අපචාර සම්බන්ධයෙන් යුක්තිය පසිඳලීමේ ප්‍රමාදය වළක්වා ගැනීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

367/2024

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මධ්‍යම රජයට, පළාත් සභාවලට සහ පෞද්ගලික අංශයට අයත් රෝහල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන්;

(ii) එම රෝහල්වල ඇති ඇඳන් සංඛ්‍යාව;

(iii) මධ්‍යම රජයේ හා පළාත් සභා රෝහල්වල ස්ථාපිත කර ඇති හදිසි ප්‍රතිකාර සේවා ඒකකවල ඇඳන් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ සිටින ලියාපදිංචි වෛද්‍යවරුන් සංඛ්‍යාව;

(ii) මේ වනවිට සේවයේ යෙදී සිටින හෙද නිලධාරින් හා හෙදි නිලධාරිනියන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන්;

(iii) වෛද්‍ය, හෙද හැර රජයේ රෝහල්වල සේවය කරනු ලබන අනෙකුත් සේවකයන් සංඛ්‍යාව එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන්;

(iv) ශ්‍රී ලංකාවේ මේ වනවිට පවතින වෛද්‍ය-රෝගීන් අනුපාතය සහ රෝගීන්-ඇඳන් අනුපාතය වෙන් වෙන් වශයෙන්;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

372/2024

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019 අප්‍රේල් 21 දින සිදු කරන ලද පාස්කු බෝම්බ ප්‍රහාරයෙන් පසු ශ්‍රී ලංකාව තුළ පුපුරන ද්‍රව්‍ය අත්අඩංගුවට ගෙන තිබේද;

(ii) එසේ නම්, පුපුරන ද්‍රව්‍ය අත්අඩංගුවට ගත් ස්ථානය, පුපුරන ද්‍රව්‍ය වර්ගය, ප්‍රමාණය, එහිදී අත්අඩංගුවට ගන්නා ලද පුද්ගලයන්ගේ නම් සහ ඔවුන් පදිංචි ස්ථාන සහ අදාළ විමර්ශනවල ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම අත්අඩංගුවට ගැනීම් සම්බන්ධයෙන් ජාතික ආරක්ෂක කවුන්සලය දැනුම්වත් කර තිබේද;

(iv) එසේ දැනුම්වත් කරන ලද දින කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

379/2024

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඉදිරි සුරකුම් ගනුදෙනු (හෙජින් ගිවිසුම්) සඳහා යොමුවීමට හේතු කවරේද;

(ii) වර්ෂ 2010 සිට මේ දක්වා සංස්ථාව විසින් ඉදිරි සුරකුම් ගනුදෙනු සිදු කරන ලද මූල්‍ය ආයතන එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත කාලය තුළදී සිදු කරන ලද ඉදිරි සුරකුම් ගනුදෙනුවලින් ලැබූ ලාභය/ අලාභය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ඉදිරි සුරැකුම් ගනුදෙනුවලදී ඉහත සංස්ථාව නියෝජනය කරන ලද නිලධාරින්/පුද්ගලයින් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉදිරි සුරැකුම් ගනුදෙනු හේතුවෙන් සිදු වූ අලාභ, වත්මන් ඉන්ධන මිල වැඩිවීම කෙරෙහි බලපා තිබේද;

(ii) එසේ නම්, එම බලපෑම අවම කර ගැනීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iii) ඉදිරියටත් මෙවැනි අලාභ සිදුවිය හැකි ඉදිරි සුරැකුම් ගනුදෙනුවලට එළැඹීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

466/2024

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බස්නාහිර පළාතේ, එක් එක් පළාත් පාලන ආයතනය විසින් කුණු කසල බැහැර කරනු ලබන ස්ථාන වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) මේ වනවිට බස්නාහිර පළාතේ විශාල වශයෙන් කුණු කසල එක්රැස් වී ඇති ස්ථාන සංඛ්‍යාව සහ ඒවා පිහිටා ඇති ස්ථාන වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ස්ථාන අවට ජීවත් වන ජනතාවට පාරිසරික ගැටලු රාශියකට මුහුණ දීමට සිදු වී තිබෙන බව දන්නේද;

(iv) එම ගැටලු විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

511/2024

ගරු රෝහණ බංඩාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මැදවච්චිය වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු අවසන් කරන ලද දිනය කවරේද;

(ii) එම වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iii) එම වෙළඳ සංකීර්ණය කඩිනමින් විවෘත කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

541/2024

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලය විසින් ස්ථාපිත කර ඇති අලෙවිසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම අලෙවිසල් ස්ථාපිත කර ඇති ප්‍රදේශ කවරේද;

(iii) ඉදිරියේදී නව අලෙවිසල් ස්ථාපිත කිරීමට පියවර ගන්නේද;

(iv) එසේ නම්, නව අලෙවිසල් ස්ථාපිත කිරීමට අපේක්ෂා කරනු ලබන ප්‍රදේශ කවරේද;

(v) මේ වනවිට මණ්ඩලයේ වාර්ෂික ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

564/2024

ගරු සංජීව එදිරිමාන්න මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා රජය විසින් රෝපණය කිරීම සඳහා ලබා දී ඇති පොල් පැළ සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒවා ලබා දෙන ලද ප්‍රදේශ සහ පැළ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම පොල් පැළ නිසි පරිදි වර්ධනය වන්නේදැයි පසුවිපරම් කරන්නේද;

(iv) එම පොල් පැළ අතරින් නිසි පරිදි වර්ධනය වෙමින් පවතින පොල් පැළ සංඛ්‍යාව කොපමණද;

(v) ඉදිරි වර්ෂය සඳහා බෙදා දීමට අපේක්ෂිත පොල් පැළ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1243/2024

ගරු කුමාරසිරි රත්නායක මහතා,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොණරාගල දිස්ත්‍රික්කයේ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් අතරින් මේ වනවිට ජනතාව අතර බෙදා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) ඉහත (ii)හි සඳහන් ඉඩම් ප්‍රමාණය එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ජනතාව අතර බෙදා දී ඇති ඉඩම් සඳහා මේ වනවිට ඔප්පු ලබා දී තිබේද;

(ii) එසේ නම්, වර්ෂ 2021 සිට මේ දක්වා පදිංචිකරුවන් සහ වගාකරුවන් වෙත ලබා දී ඇති ඔප්පු සංඛ්‍යාව සහ ඊට අදාළ ඉඩම් ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඔප්පු ලබා දී නොමැති ඉඩම් සඳහා ඉදිරියේදී ඔප්පු ලබා දීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?